මහනුවර නගරය සහ තදාසන්න ප්‍රදේශයන්හි

ජාත්‍යන්තර සංචාරක කර්මාන්තය

# INTERNATIONAL TOURISM IN THE CITY OF KANDY AND ITS VICINITY

By

R.M. Delani V. Saluwadana

A Thesis Submitted to the University of Peradeniya

in partial fulfilment of the requirements of the

degree of Master of Philosophy.

University of Peradeniya,

Sri Lanka.

November 1995/96.

555841

**Abstract**

The main objective of this thesis is to identify the role of international tourism industry in regional development. Although international tourism has been depend with the social science, geography is the most appropriate discipline to study international tourism simply because of the fact that tourist attraction is fundamentally based on the spatial differentiation of the physical and social world.

The study area of the research is Kandy. From the point of view of international tourism the area around the Temple of Tooth can be considered the core area and the rural Kandy the periphery. The field research was conducted in the core area and twelve randomly selected tourist attractions from the periphery.

International tourism can be considered as one of the main development strategist in the $20^{th}$ century. The third world countries perused international tourism as a convenient economic growth strategy. Generation of employment, rise in income, and regional development are some of the expected results of the international tourism industry. Yet, international tourism also led to changes in the local social, cultural and environmental spheres. On the other hand the positive benefits of international tourism were not up to the expectation of those countries.

The experience of international tourism in Kandy also resonate this experience.

Although international tourism in Kandy dates back to colonial era, it became an industry only since the 1960s. Although both the private and state sector has entered in large

scale, the small and informal sector is almost non existent in the tourism industry in Kandy. There are no plans to involve the small and informal sector in international tourism industry in Kandy even today.

As a result of the changes in the international tourism industry in the recent decades the demand for small scale sector has increased almost challenging the large scale sector. In this context, with systematic development of the small scale and informal sector, international tourism can be an effective regional development strategy.

This thesis examines the economic, social, cultural and environmental impacts of international tourism in city of Kandy and its vicinity.

PERMANENT REFERENCE
FOR USE IN THE
LIBRARY ONLY

# පෙරවදන

මෙම පර්යේෂණ ග්‍රණ්ථයේ මූලික අරමුණ වූයේ ප්‍රාදේශීය සංවර්ධන ක්‍රියාවලියේදී ජාත්‍යන්තර සංචාරක කර්මාන්තයේ දායකත්වය හඳුනා ගැනීමයි. ජාත්‍යන්තර සංචාරක කර්මාන්තය පිළිබඳ අධ්‍යන සමාජ විද්‍යා විෂයන් හා සම්බන්ධව ආයතනගත වූවකි. භූගෝල විද්‍යා ශික්ෂණය මතින් ජාත්‍යන්තර සංචාරක කර්මාන්තය සරල ලෙසින් අධ්‍යයනයට පහසු වී ඇත. එයට හේතු වූයේ සංචාරක ආකර්ෂණයේ මූලික පදනම ගොඩනැඟී ඇත්තේ ප්‍රදේශයක් සතු වූ භෞතික හා සාමාජීය විවිධත්වය මත වීමයි.

මෙම පර්යේෂණයට ලක් කළ පෙදෙස වූයේ මහනුවරයි. මහනුවර පවත්නා ජාත්‍යන්තර සංචාරක කර්මාන්තයේ මූලික හර ප්‍රදේශය වූයේ දළදා මාළිගාව අවට බිමයි. එයට තදාසන්නව පවතින ග්‍රාමීය සංචාරක පෙදෙස් මහනුවර ජාත්‍යන්තර සංචාරක කර්මාන්තයේ පර්යන්ත ස්ථාන ලෙස හඳුනා ගත හැකිය.

20වන ශත වර්ෂයේදී ප්‍රදේශ සංවර්ධනයේ මූලික යෙදවුමක් ලෙස ජාත්‍යන්තර සංචාරක කර්මාන්තය පිළිගෙන ඇත. සිය ආර්ථික ගැටළු ජාත්‍යන්තර සංචාරක කර්මාන්තය මතින් වඩා පහසුවෙන් විසඳාගත හැකි බවට තුන්වන ලෝකයේ කලාප පිළිගනියි. ජාත්‍යන්තර සංචාරක කර්මාන්තය මතින් සිය ආර්ථිකයේ රැකියා වර්ධනය, ආදායම් ඉහල දැමීම, හා ප්‍රාදේශීය සංවර්ධනය අපේක්ෂා කෙරිණි. එමෙන්ම ජාත්‍යන්තර සංචාරක කර්මාන්තය ඇදාගත් ප්‍රදේශ සිය භෞතික හා

සංස්කෘතික පරිසරය වෙනස් වීමකටද ලක් විය. මෙනිසා සංවර්ධනය වෙමින් පවත්නා කළාපවල ජාත්‍යන්තර සංචාරක කර්මාන්තය මගින් අපේක්ෂිත ලාභයේ ධන වර්ධනය මන්දගාමී විය. තුන්වන ලෝකය ලත් එම අත්දැකීම් වල පිළිඹිබුව මහනුවර ද සටහන්ව ඇත.

මහනුවරට හිමිවූ ජාත්‍යන්තර සංචාරක කර්මාන්තයේ අතීතය යටත් විජිත සමය තෙක් පැතිර ඇත. 1960න් පසු නිල ජාත්‍යන්තර සංචාරක කර්මාන්තය ස්ථාපිත විය. රාජ්‍ය හා පෞද්ගලික අංශයේ දැඩි අවධානය මහා පරිමාණ අංශයටම මහනුවරදීද යොමුව ඇත. ප්‍රදේශයටම ආවේනික කුඩා පරිමාණ හා අවිධිමත් අංශ මත වර්ධනය වන සංචාරක කර්මාන්තයක ඵලදායිතාවය වර්ධනයට සැලසුම් සම්පාදනයක කාලීන අවශ්‍යතාවයක් පවතියි.

වත්මන් ජාත්‍යන්තර සංචාරක කර්මාන්තයේ පවත්නා ඉල්ලුම කුඩා පරිමාණ අංශ වෙත කරන යොමුව හේතුවෙන් මහා පරිමාණ සංචාරක සේවාවන්ට අභියෝගයක් එල්ල කොට ඇත. මෙම සංදර්භය මත කුඩා පරිමාණ හා අවිධිමත් සංචාරක සේවාවන්ගේ ක්‍රමාන්විත සංවර්ධනය වඩා වැදගත්ය. එවැනි උපාංග ප්‍රදේශයක පවත්නා සංචාරක කර්මාන්තයේ ඵලදායිතාවයට පාදකයක් කරගත හැකිය.

මෙම පර්යේෂණ නිබන්ධනයෙන් විවරණය කලේ ජාත්‍යන්තර සංචාරක කර්මාන්තය මහනුවර ආර්ථික, සමාජීය, සංස්කෘතික හා පාරිසරික අංශයනට කළ බලපෑම හඳුනා ගැනීමය.